PAFFREL
නිදහස් හා සාධාරණ මැතිවරණයන් සඳහා ජනතා ක්‍රියාකාරීත්වය.
சுதந்திரமானதும் நியாயமானதுமான தேர்தல்களுக்கான மக்கள் செயற்பாடு.
PEOPLE'S ACTION FOR FREE & FAIR ELECTIONS

# 2024 පාර්ලිමේන්තු මැතිවරණය

## මැතිවරණ දින වාර්තාව

**2024 නොවැම්බර් 14**

2024 පාර්ලිමේන්තු මැතිවරණය නොවැම්බර් 14 වැනි දින පැවැත්විණි. ඡන්දය ප්‍රකාශ කිරීම සඳහා ඡන්ද මධ්‍යස්ථාන 13,421ක් හරහා පුද්ගලයන් 17,140,354 ක් සුදුසුකම් ලබා තිබුණි. මෙවර පාර්ලිමේන්තු මැතිවරණය සඳහා දේශපාලන පක්ෂ සහ ස්වාධීන කණ්ඩායම්වලින් අපේක්ෂකයන් 8,888 ක පිරිසක් තරග කළහ. කෙසේ වෙතත්, පසුගිය 2024 ජනාධිපතිවරණය සහ 2020 පාර්ලිමේන්තු මැතිවරණය හා සසඳන විට, ඡන්දය ප්‍රකාශ කිරීමේ ප්‍රතිශතය සැළකිය යුතු ලෙස අඩු වූ අතර, එය 60%-65% අතර ප්‍රමාණයක පවතී.

ශ්‍රී ලංකා මැතිවරණ කොමිෂන් සභාවේ මගපෙන්වීම යටතේ සහ මැතිවරණ නිරීක්ෂණ කණ්ඩායම් ඇතුළු පාර්ශ්වකරුවන්ගේ මැදිහත්වීමෙන් 2024 පාර්ලිමේන්තු මැතිවරණය සාපේක්ෂ ලෙස සාමකාමීව නිමාවිය. නිදහස් හා සාධාරණ මැතිවරණයක් සහතික කිරීම සඳහා මැතිවරණ කොමිසම, පූර්ව මැතිවරණ සමයේ සිට මැතිවරණ දිනය දක්වා තීරණාත්මක කාර්යභාරයක් ඉටු කළේය. මෙම මැතිවරණ ක්‍රියාවලිය පුරාවට ශ්‍රී ලංකා පොලීසිය, සිද්ධීන් කිහිපයකදී හැරුණුකොට, නීතිය හා සාමය කාර්යක්ෂමව හා අපක්ෂපාතීව පවත්වාගෙන යාමට අදාළ ආයතන සමග සහයෝගයෙන් කටයුතු කළේය.

පැෆ්රල් සංවිධානය විසින් මැතිවරණ නීති උල්ලංඝනය කිරීම් සහ ප්‍රචණ්ඩත්වය වැළැක්වීම මෙන්ම, පුරවැසියන්ගේ ඡන්ද අයිතිය ආරක්ෂා කිරීම වෙනුවෙන් කටයුතු කිරීම සම්බන්ධයෙන්, ශ්‍රී ලංකා පොලීසිය සහ මැතිවරණ කොමිසන් සභාවට තම කෘතඥතාව පළ කරයි. අද දින පැවැත්වූ සන්සුන් හා සාමකාමී මැතිවරණය සඳහා මැතිවරණය සඳහා තරග කළ සියලුම දේශපාලන පක්ෂ සහ ස්වාධීන කණ්ඩායම් මෙන්ම පුරවැසියන්ගේද දායකත්වය ලැබුණු බැවින්, ඔවුන් වෙනුවෙන්ද මෙම අගය කිරීම හිමි වේ.

මැතිවරණ නිරීක්ෂකයින් 5,000 කට වැඩි පිරිසකගේ සක්‍රීය සහභාගීත්වයෙන් ඡන්ද මධ්‍යස්ථානවලින් සැළකිය යුතු ප්‍රමාණයක් ආවරණය කිරීමට පැෆ්රල් සංවිධානය කටයුතු කරන ලදී. මැතිවරණ දිනය තුළ, පැෆ්රල් සංවිධානය වෙත පැමිණිලි 223 ක් (තහවුරු කළ පැමිණිලි 197 ක් සහ තහවුරු නොකළ පැමිණිලි 26 ක්) වාර්තා විය. මේ අතරින් නීති විරෝධී මැතිවරණ ප්‍රචාරණ සහ ඡන්දදායකයින්ට බලපෑම් කිරීමට උත්සාහ කිරීම ඇතුළු, මැතිවරණ නීති උල්ලංඝණය කිරීම සම්බන්ධයෙන් පැමිණිලි 219 ක් වාර්තා විය.

කාත්තන්කුඩි, තිස්සමහාරාම, බදුල්ල, වියළුව, පුත්තලම, වෙන්නප්පුව, පදිරිප්පු, කුරුණෑගල, ගාල්ල, ගම්පහ, තලාව, අරණායක, නුවරඑළිය, මාතර, රත්නපුර, අනුරාධපුර, කළුතර, මීනුවන්ගොඩ, හලාවත, කොළඹ, ගම්පොල, දිවුලපිටිය, මහනුවර සහ කොත්මලේ යන ප්‍රදේශවලින් මැතිවරණ නීති උල්ලංඝණය කිරීමේ සිද්ධීන් කිහිපයක් වාර්තා විය. දඹාන ආදිවාසී ගම්මානයේ ආදිවාසී උප නායකතුමා ඇතුළුව ඡන්දය ප්‍රකාශ කිරීමට ගිය පවුලේ පිරිසට සිය ඡන්දයේ දීම වළක්වා ඇති අතර, එයට හේතු වී ඇත්තේ උප නායකතුමන් තම සංස්කෘතික අනන්‍යතාවයේ සළකුණක්වවන කෙටේරි පොරොව කරමත තබා ගනිමින් ඡන්දය ප්‍රකාශ කිරීමට මධ්‍යස්ථානයට පැමිණි බව පවසමින්, මධ්‍යස්ථාන භාරකාර නිලධාරී, උපනායකතුමන්හට ඡන්ද ප්‍රකාශ කිරීමට අවස්ථාව ලබා දී නැත. ඒ හේතුවෙන් උප නායකතුමන් ඇතුළු පවුලේ සියලුම දෙනා ඡන්ද ප්‍රකාශ කිරීමෙන් වැළකී සිට ඇත. මෙම සිද්ධිය මගින් පිළිබිඹු වන්නේ, මේ සම්බන්ධයෙන් ආදීවාසි ප්‍රදේශ ආවරණය කරන, සහකාර තේරීම් භාර නිලධාරීන් සහ ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරුන්හට මැතිවරණ කොමිසම මගින් පැහැදිලි මාර්ගෝපදේශ ලබා දිය යුතු බවයි.

පැෆ්රල් සංවිධානයේ නිරීක්ෂකයින් වාර්තා කරන ලද පරිදී, ඡන්ද විමසීම පැවැත්වෙන දිනයේ ඡන්ද මධ්‍යස්ථාන ආශ්‍රිතව නීතිවිරෝධී මැතිවරණ ප්‍රචාරක කටයුතු, මහජන රැස්වීම්, බිය ගැන්වීම්, ඡන්දදායකයින්ට බලපෑම් කිරීම සහ ප්‍රවාහනය කිරීම සම්බන්ධයෙන් බරපතල සිදුවීම් කිසිවක් වාර්තා වී නොමැත. මහියංගනය සහ කොටපොළ යන ප්‍රදේශවලින් පහරදීම් සහ බිය වැද්දීම් ලෙස ගණන් ගන්නා සිදුවීම් වාර්තා විය. එසේ වුවද, අවසාන ප්‍රතිඵලයට සැළකිය යුතු මට්ටමේ බලපෑමක් ඇති කළ ප්‍රධාන සිදුවීම් හෝ තත්ත්වයන් මැතිවරණ දිනය තුළ වාර්තා නොවීය.

2024 ජනාධිපතිවරණයට සහ 2020 පාර්ලිමේන්තු මැතිවරණයට සාපේක්ෂව පූර්ව මැතිවරණ සමයේ සිට ඡන්දය ප්‍රකාශ කරන දිනය දක්වා රාජ්‍ය බලය, දේපළ සහ නිලධාරීන් අයුතු ලෙස භාවිත කිරීම පිළිබඳ සිද්ධීන් සහ පැමිණිලි අඩුවීම වැදගත් කරුණකි.

සේවකයන්ට ඡන්දය ප්‍රකාශ කිරීම සඳහා නිවාඩු ලබාදීමේ ප්‍රතිපාදන ලබා නොදීම සම්බන්ධයෙන් පැෆ්රල් වෙත පැමිණිලි කිහිපයක් ලැබුණි. සේවකයින්ට ඡන්දය ප්‍රකාශ කිරීම සඳහා නිවාඩු ලබා දීම සම්බන්ධයෙන් මැතිවරණ කොමිසම විසින් පැහැදිලි මාර්ගෝපදේශ සහ නියෝග ලබා දී ඇතත්, පෞද්ගලික සහ මූල්‍ය සමාගම්වල සමහර කළමණාකාරීත්වයන් සහ පරිපාලන අංශ ඒවා නිසි ලෙස අනුගමනය කර නොමැත. ඡන්දදායකයින්ගේ ඡන්දය ප්‍රකාශ කිරීමේ අයිතිය සඳහා ප්‍රමාණවත් ආරක්ෂාවක් ස්ථාපිත කිරීමට මැතිවරණ කොමිසම සතුව සුදුසු අධිකාරියක් පැවතිය යුතු බව පැෆ්රල් සංවිධානය ප්‍රකාශකර සිටී.

හැෂ්ටැග් පරපුර සහ පැෆ්රල් සංවිධානය සහයෝගීව, මැතිවරණ දිනයේදී Facebook හි මුදල් ගෙවන ලද දැන්වීම් 29 ක්, ප්‍රචාරණ අන්තර්ගතයට අදාළ සිද්ධීන් 274 ක් සහ මැතිවරණ නීති උල්ලංඝණය කිරීම් සහ වෛරී ප්‍රකාශන සම්බන්ධයෙන් සිද්ධීන් 30 ක් සමාජ මාධ්‍ය තුළ අධීක්ෂණය කරන ලදී.


පැෆ්රල් සංවිධානය විසින් යෙදවූ ජංගම නිරීක්ෂකයින්, දිගුකාලීන නිරීක්ෂකයින් සහ ස්ථානගත නිරීක්ෂකයින් විසින් වාර්තා කළ පරිදි, ඡන්ද මධ්‍යස්ථානවල අක්‍රමිකතා සිදුව ඇත්තේ ඉතා සුළු ප්‍රමාණයකිනි. ඔවුන්ට ඡන්ද පොළ නිලධාරීන්ගෙන් ප්‍රමාණවත් සහයෝගයක් සැපයුණු අතර, ගම්පහ කලල්පිටිය, කළුතර මීවනපලාන, කෑගල්ල යටියන්තොට සහ කොළොන්නාව යන ප්‍රදේශවල පිහිටි ඡන්ද මධ්‍යස්ථානවල ව්‍යතිරේඛ කිහිපයක් හැරුණු විට, බොහෝ ඡන්ද මධ්‍යස්ථානවල ආබාධිත පුද්ගලයින්ට ඡන්දය ප්‍රකාශ කිරීමට ප්‍රවේශ විය හැකි සහ පහසුවන පරිදි පහසුකම් සැලසුම් කර තිබුණි.

පෙර පැවැත්වුණු මැතිවරණ හා සසඳන විට, ජාතිය, ආගම හෝ වාර්ගිකත්වය මත පදනම්ව ඡන්දදායකයින්ට බලපෑම් කිරීමට සහ ඔවුන්ව ආකර්ෂණය කිරීමට ගත් උත්සාහයන් සැලකිය යුතු ලෙස අඩු මට්ටමක පැවතිණි. මැතිවරණ නීති උල්ලංඝනය කිරීම් සහ ඩිජිටල් සහ සයිබර් අවකාශ මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය පිළිබඳ වාර්තා තිබියදීත්, අපේක්ෂකයින්ට, ඔවුන්ගේ මතවාදයට සහ ඔවුන්ගේ ව්‍යාපාරවලට එරෙහි වෛරී ප්‍රකාශ එතරම් වැදගත් වී නැත.

නිකවැරටිය ප්‍රදේශයේ ඡන්ද මධ්‍යස්ථානයක රාජකාරියෙහි නිරත වෙමින් සිටියදී අභාවප්‍රාප්ත වූ පොලිස් නිලධාරියෙකු, උරුම්පිරායි හින්දු විද්‍යාලයේ ඡන්ද මධ්‍යස්ථානයක මැතිවරණ රාජකාරියේ යෙදී සිටි තවත් පොලිස් නිලධාරියෙක් සහ කැස්බෑව ඡන්ද මධ්‍යස්ථානයක රාජකාරියේ යෙදී සිටි ස්ථානාධිපතිනියකගේ පවුල් වෙත පැෆ්රල් සංවිධානය සිය සාතිශය සංවේගය පළ කරයි.

පූර්ව මැතිවරණ කාලසීමාවේ සිට ඡන්දය විමසීමේ දිනය දක්වා, පැෆ්රල් සංවිධානය විසින් දිස්ත්‍රික් සම්බන්ධීකාරකවරුන් 34 ක්, ක්ෂේත්‍ර සම්බන්ධීකාරකවරුන් 25 ක්, තැපැල් ඡන්ද නිරීක්ෂකයින් 1000 ක්, ස්ථානීය නිරීක්ෂකයින් 3000 ක්, ජංගම කණ්ඩායම් නිරීක්ෂකයින් 1296 ක්, ජංගම කණ්ඩායම් 324 ක්, මැතිවරණ වියදම් සීමා නිරීක්ෂකයින් 36 ක්, දිගු කාලීන නිරීක්ෂකයින් 155 ක්, මැතිවරණ ආරවුල් නිරාකරණ මධ්‍යස්ථාන නිරීක්ෂකයින් 25 ක්, ගණන් කිරීමේ මධ්‍යස්ථාන නිරීක්ෂකයින් 200 ක් සහ විශේෂ ජංගම ඒකක 06 ක් හරහා විශේෂ ජංගම නිරීක්ෂකයින් 24 ක් හරහා මැතිවරණ නිරීක්ෂණ පවත්වාගෙන යනු ලැබීය. පැෆ්රල් සංවිධානය විසින් සමස්ත මැතිවරණ ක්‍රියාවලිය පුරාවටම සිය නිරීක්ෂක කණ්ඩායම සතු වූ නොසැළෙන සහයෝගීතාවය සහ කැපවීම බෙහෙවින් අගය කරනු ලබයි.

මැතිවරණවල ප්‍රජාතන්ත්‍රවාදී ස්වභාවය පවත්වා ගැනීම සඳහා පැෆ්රල් සංවිධානය දිගින් දිගටම මැදිහත් වේ. පශ්චාත් මැතිවරණ කාලසීමාව තුළ සුපරීක්ෂාකාරීව සහ සන්සුන්ව සිටින ලෙස පැෆ්රල් සංවිධානය සියලුම පුරවැසියන්ගෙන්, දේශපාලන ක්‍රියාකාරීන්ගෙන් සහ බලධාරීන්ගෙන් ඉල්ලා සිටී.



රෝහණ හෙට්ටිආරච්චි
විධායක අධ්‍යක්ෂ